ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2073/15 - 2018 මැයි මස 31 වැනි බ්‍රහස්පතින්දා - 2018.05.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1973 අංක 25 දරන ක්‍රීඩා නීතිය

1973 අංක 25 දරන ක්‍රීඩා නීතියේ 41 වන වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් පනවන ලද නියෝගය

ෆයිසර් මුස්තාෆා, ජනාධිපති නීතිඥ,
පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍ය.

2018 මැයි මස 31 වැනි දින,
කොළඹ.

නියෝගය

2018 මැයි මස 31 වැනි දින පැවැත්වීමට නියමිත ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ නිලධාරී මණ්ඩලය තෝරා පත්කරගැනීම කල්තැබීම සහ යළි පැවැත්වීම සම්බන්ධයෙන් අංක CA WRIT 186/2018 දරන අභියාචනාධිකරණ නියෝගය ප්‍රකාරව මැයි මස 30 වැනි දින අතුරු නියෝගයක් නිකුත් කර ඇති බැවින් ද,

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වර්තමාන නිලධාරී මණ්ඩලයේ නිල කාලසීමාව 2018 මැයි මස 31 වැනි දිනෙන් අවසන් වීමට නියමිත බැවින් ද,

ශ්‍රී ලංකා ක්‍රිකට් පාලක සභාවේ පරිපාලනය සහතික කිරීම සඳහා නිසි බලධාරියෙකු පත් කළ යුතු හෙයින් ද,

පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍ය ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාෆා වන මම, 1973 අංක 25 දරන ක්‍රීඩා නීතියේ සංශෝධිත 41 වැනි වගන්තිය ප්‍රකාරව ක්‍රිකට් පාලක මණ්ඩලයේ පරිපාලන කටයුතු අඛණ්ඩව ඉටුකිරීම සඳහා නිසි පරිපාලනය සඳහා අවශ්‍ය වෙනත් කටයුතු ඉටුකිරීම සඳහා 2018 ජුනි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පළාත් සභා, පළාත් පාලන සහ ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම් හේවා තොණ්ඩිලගේ කමල් පත්මසිරි මහතා නිසි බලධාරියා වශයෙන් පත්කරමි.

1A - PG 3878 — 57 (2018/05) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*